පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව **සබරගමුව** - සති පාසල

විෂය - චිත්‍ර කලාව

මාර්තු මාසය - 02 සතිය


සැකසුම - එල්.මහේෂ් විජේවර්ධන

ර/නිවි/කරවිට මධ්‍ය විද්‍යාලය


ශ්‍රේණිය - 9

නිපුණතාව - පරිසරයේ පවත්නා ද්‍රව්‍ය සම්පිණ්ඩනාත්මකව චිත්‍රණය කරයි

නිපුණතා මට්ටම - ස්වභාවික හා නිර්මිත වස්තු රේඛාවෙන් අඳියි

ක්‍රියාකාරකම - ඝනකාභ හැඩැති වස්තුවක්, වතුර බොන ප්‍රමාණයේ වීදුරුවක්, ගෝලාකාර පලතුරු ගෙඩියක්, රේඛාවෙන් අඳිමු

පැවරුම - පහත පියවර අනුව ක්‍රියාකාරකම කරන්න

පියවර (1) - ඔබ නිවසේ ඇති 20cm * 10cm * 10cm ප්‍රමාණයේ පමණ කාඩ්බෝඩ් පෙට්ටියක්, වතුර වීදුරුවක්, තැඹිලි ගෙඩියක්, සපයා ගන්න.

පියවර (2) - සපයා ගත් ද්‍රව්‍යන් අතට ගෙන හොඳින් ස්පර්ෂ කරමින් ඒවායේ හැඩය, මතුපිට ස්වභාවය, ඝනත්වය, ප්‍රමාණය ආදාය සියුම් ලෙස නිරීක්ෂනය කරමින් අවබෝධය ලබා ගන්න

පියවර (3) - මීටර් 2 පමණ ඇස් මට්ටමේ දුරින් එම එක් එක් ද්‍රව්‍යන් තබා මූලික හැඩතල ඔස්සේ වෙන වෙනම ඒවායේ මූලික හැඩය අඳින්න

පියවර (4) - එසේ වෙන වෙනම ඇඳගත් මූලික හැඩතලවල එළිය අඳුර, ඝනත්වය, පරිමාණය, පර්යාවලෝකනය ආදිය යොදා එම ද්‍රව්‍යයන් පැන්සල් මාධ්‍යයෙන් ප්‍රතිනිර්මාණය කරන්න

පියවර (5) - ඉහත වෙන වෙනම තැබූ ද්‍රව්‍යයන් එකතුකොට සම්පින්ඩනයක් ආකාරයෙන් සකසා ඉහත පියවර අනුවම චිත්‍රණය කරන්න